ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2128/28 – 2019 ජුනි 20 වැනි බ්‍රහස්පතින්දා – 2019.06.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුංවත්ත බාගේ පත්තුව/රයිගම් කෝරළේ සුළු කොට්ඨාසයේ, කැන්නන්තුඩාව (652) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ සහ කැන්නන්තුඩාව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ka/MIL/2018/287 හා 2018.09.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – ජම්බුගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.3502

උතුරට: මාර්ගය සහ විජේසිංහ විතානගේ යසවතී හිමිකම් කියන ජම්බුගහවත්ත; නැගෙනහිරට: ඇළ; දකුණට: හිමිකම් කියන අය සොයාගත නොහැකි මුත්තෙට්ටුවේකුඹුර සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා), මාර්ගය, මෙම ඉඩමේ ඉතිරි කොටස සහ මාර්ගය.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/2/2018/සීඊබී/40.
2019 අප්‍රේල් මස 11 වැනි දින.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 – 78